# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2198/13 - 2020 ඔක්තෝබර් මස 20 වැනි අඟහරුවාදා - 2020.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**අධිකරණ අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිණිස මහජන අදහස් ලබාගැනීමට කරනු ලබන ආරාධනාවයි**

ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සම්පාදනය කර එය අමාත්‍ය මණ්ඩලයේ සහ පාර්ලිමේන්තුවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කිරීමේ කාර්යය අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂඥ කමිටුවක් වෙත පවරා ඇති බව ශ්‍රී ලංකාවාසී මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් යම් පුරවැසියෙකු තම යෝජනා, මත හෝ අදහස් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේනම්, එම යෝජනා, මත හෝ අදහස් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා යන කවර වූ හෝ මාධ්‍යයකින් 2020 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ එදිනට පෙර විශේෂඥ කමිටුවේ ලේකම් අමතා යොමු කළ හැකිය.

මෙහි දී, පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්නේනම් මැනවි :-

1. සියලුම කරුණු දක්වීම් A4 ප්‍රමාණයේ කඩදාසියක යතුරු ලියනය කර තිබීම.
2. පහත සඳහන් එක් එක් මාතෘකා සඳහා වෙන් වූ පිටුවක් යොදා ගැනීම.
   - අ. රාජ්‍යයේ ස්වභාවය
   - ආ. මූලික අයිතිවාසිකම්
   - ඇ. භාෂාව
   - ඈ. රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම
   - ඉ. විධායකය (ජනාධිපති/අමාත්‍ය මණ්ඩලය/රාජ්‍ය සේවය)
   - ඊ. ව්‍යවස්ථාදායකය
   - උ. ඡන්ද බලය සහ ජනමතවිචාරණය ඇතුළුව මැතිවරණය
   - ඌ. බලය විමධ්‍යගත කිරීම/බලය බෙදාහැරීම/බලය වෙන්කිරීම
   - එ. අධිකරණය

1A - G 32826 — 29 (2020/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඒ. රාජ්‍ය මුදල්

ඔ. රාජ්‍ය ආරක්ෂාව

ඕ. ඉහත නිශ්චිතව සඳහන් නොකරන ලද යම් වෙනත් විෂයන්.

ඉදිරිපත් කරන කරුණු ඉතාමත් සංක්ෂිප්තව සඳහන් කිරීම යෝග්‍ය වේ.

ඔබගේ සැලකිරීම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් යොමු කළ හැකිය.

**තැපැල් ලිපිනය :**

කාමර අංක 32 [Block 02]
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

**විද්‍යුත් තැපැල් ලිපිනය :**

expertscommpublic@yahoo.com

ලේකම්,
නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ විශේෂඥ කමිටුව.